# මධ්‍යම පරිසර අධිකාරිය
# மத்திய சுற்றாடல் அதிகாரசபை
# Central Environmental Authority

පරිසර පියස, 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"பரிசர பியச", 104, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை, இலங்கை.
"Parisara Piyasa", 104, Denzil Kobbekaduwa Mawatha, Battaramulla, Sri Lanka. Web: www.cea.lk


අපේ යොමුව / எமது தொடர்பு / Our Ref. CEA/EPC/GEN/EPL/2020 | ඔබේ යොමුව / உமது தொடர்பு / Your Ref. | දිනය / திகதி / Date 21.03.2020

**පවතින වියළි දේශගුණික තත්වය හමුවේ පරිසර පද්ධති රැකගනිමු.**

ශ්‍රී ලංකාවේ පවතින වියළි දේශගුණික තත්වය හේතුවෙන් ජල මූලාශ්‍ර සිඳී යාම ඇතුළුව විවිධ වූ පාරිසරික ව්‍යසනයන්ට මුහුණ පෑමට සිදුව ඇත. මෙම තත්වය හමුවේ මිනිසුන් විසින් සිදුකරන කැළෑ ගිනි තැබීම් හේතුවෙන් ද ජල මූලාශ්‍ර හා ජල පෝෂක ප්‍රදේශවලට මහත් තර්ජනයක් එල්ල වී ඇත.

මේ හේතුවෙන් ශ්‍රී ලංකාවාසීන් අනාගතයේදී ජල හිඟයකට මුහුණ පෑමේ අවධානමකට ලක්ව ඇත. වනාන්තරවල පවතින ජෛව විවිධත්වයට හානි පැමිණීම, ක්ෂුද්‍ර දේශගුණික තත්වවලට සිදුවන බලපෑම් යනාදී හේතු මත පාරිසරික සමතුලිතතාවයේ අඛණ්ඩ පැවැත්මට වියළි කාලගුණික තත්වයක් ඇතිවීම මගින් බාධා ඇතිවේ.

මෙම කැලෑ ගිනි තැබීම් බහුලව සිදුවන්නේ අප රටේ පවතින රක්ෂිත වනාන්තරවලට ආසන්නයේ පවතින ප්‍රදේශ ආශ්‍රිතව වීමත්, මෙම ක්‍රියාකාරකම් සිදු කරන පුද්ගලයන් නිශ්චිතව හඳුනාගැනීම අපහසුවීමත් යන හේතු මත මෙලෙස කැලෑ ගිනි තැබීම මැඩපැවැත්වීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම අදාළ ආයතනවලට අභියෝගයක්වී ඇත.

එබැවින් මෙම කැලෑ ගිනිතැබීම් පාලනය කර ජල මූලාශ්‍ර හා ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කර ගැනීම සඳහා මහජනතාව දැනුම්වත් වීම හා එමගින් ඔවුන්ගේ දායකත්වය අදාළ ආයතන වෙත ලබා ගැනීම බෙහෙවින් අත්‍යවශ්‍ය වේ. මෙනිසා තම ප්‍රදේශයේ, තම නිවාස ආශ්‍රිතව වනාන්තර ප්‍රදේශ පවතින්නේ නම්, එම වනාන්තර ආශ්‍රිතව කැලෑ ගිනි තැබීම් සිදුවන්නේනම් වහාම ඒ පිළිබඳව තම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිවරයා වෙත දැනුම්දීමට ප්‍රදේශවාසීන් විසින් කටයුතු කිරීම ඉතා වැදගත්ය.

අදාල ග්‍රාම නිලධාරීවරයා විසින් ඒ සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කරනු ඇත.

මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් කාර්යාල, දිස්ත්‍රික් කාර්යාල සහ පාසල් දරුවන්ගෙන් සැදුම්ලත් පරිසර නියමු කණ්ඩායම් යන ජාලය හරහා අදාළ දැනුම්වත් කිරීම් තුළින් මෙම කැලෑ ගිනි තැබීම් පාලනය සඳහා අවශ්‍ය දායකත්වය ලබාදීමට මධ්‍යම පරිසර අධිකාරිය කටයුතු කරනු ඇත.

මධ්‍යම පරිසර අධිකාරියේ පණිවිඩයක්


| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **Chairman** | Tel : 2872361, 2872348<br>Fax : 2872347 | **Director General** | Tel : 2872359<br>Fax : 2872608 | **General Office** | Tel : 2872278, 2873447, 2873448<br>7877277-280 | Complaint: 2888999<br>Compliance Monitoring: 2076152 |